පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව
මහනුවර දිස්ත්‍රික්කය
----------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන
---------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජූනි 14 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට පස්බාගේ කෝරලේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
--------------------------------------

1.3.1 නොසැසඳුණු ගිණුම්
----------------------

දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ ගිණුම අනුව ශේෂය රු.12,696,019 ක් වූ නමුත්, ශේෂ සනාථ කිරීමේ ලිපිය අනුව එම ශේෂය රු.12,626,425 ක් වූයෙන්, රු.69,594 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
----------------------------------

(අ) ලැබිය යුතු ගිණුම්
------------------

2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 18 ක එකතු වටිනාකම රු.20,280,009 ක් වූ අතර, එයින් අවුරුදු 05 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන් හි එකතුව රු.1,673,480 ක් වී තිබුණි. 2018 මාර්තු 31 දිනට රු.17,402,623 ක ශේෂයක් තවදුරටත් අය විය යුතුව පැවතුණි.

(ආ) ගෙවිය යුතු ගිණුම්
---------------------

2017 දෙසැම්බර් 31 දිනට රු.6,003,296 ක් වූ ගෙවිය යුතු ගිණුම් ශේෂ 06 ක එකතු වටිනාකමින් අවුරුදු 01 ත් 05 ත් අතර කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂ එකතුව රු.2,724,288 ක් වී තිබුණි. 2018 මාර්තු 31 දිනට රු.5,103,266 ක ශේෂයක් තවදුරටත් අය විය යුතුව පැවතුණි.

**1.3.3** විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම
-----------------------------------------------------

**අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා, එකතුව රු.43,000 ක් වූ ගිණුම් විෂයන් 02 ක් විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.**

**1.3.4** අනුකූල නොවීම්

-------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | | | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|---|
| | | | රු. | |
| (අ) | | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | |
| | | 178(7)(1) හා (2) | 290,953 | විධිමත් ටෙන්ඩර් පරිපාටිය අනුගමනය කිරීමකින් තොරව අවස්ථා 05 කදී ටයර්, යන්ත්‍ර හා උපකරණ කොටස් මිලදී ගෙන තිබුණි. |
| (ආ) | | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | |
| | (i) | මුදල් රෙගුලාසි 571(3) | 49,075 | 2014 සිට 2016 දක්වා කාල පරිච්ඡේදය තුළ අවස්ථා 04 ක දී තැන්පත් කර තිබූ අත රැඳවුම් මුදල් සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විටත් පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි. |
| | (ii) | මුදල් රෙගුලාසි 1653 | 52,250 | කැබ් රථයක් කි.මී.550 ක් ධාවනය කල දින 11 ක් සඳහා වාහනය භාවිතා කළ නිලධාරියා විසින් ධාවන සටහන්වල අත්සන් කර නොතිබුණි. |
| (ඇ) | | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | | |
| | | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛයේ 3.1 ඡේදය | -- | සභාව සතු ජීප් රථයක් 2013 නොවැම්බර් 21 දිනෙන් පසුව ඉන්ධන දහනයට අදාළව පරීක්ෂාවක් සිදු කර නොතිබුණි. |
| (ඈ) | | වෙනත් චක්‍රලේඛ | | |
| | | 2016 මාර්තු 17 දිනැති අංක 2016/3 අංක දරන පළාත් පාලන කොමසාරිස්වරයාගේ චක්‍රලේඛයේ 5(I) ඡේදය | | වසර 05 කට වරක් තක්සේරුගත බදුකුලිය සංශෝධනය කර නව ගිවිසුම්වලට එළඹිය යුතු වුවත්, සිල්වාස්ලැන්ඩ් කඩ කාමර 15 ක් සඳහා 2008 වර්ෂයේ සිට |

ගිවිසුම් සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද සංශෝධිත මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.5,341,786 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.12,951,380 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කල ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 4,681,000 | 4,938,166 | 4,786,131 | 3,414,812 | 4,312,000 | 4,637,602 | 4,196,659 | 3,262,775 |
| (ii) | කුලී | 4,245,000 | 2,276,529 | 2,156,125 | 276,042 | 5,063,000 | 1,722,536 | 1,638,663 | 138,804 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 855,300 | 854,857 | 749,357 | 435,100 | 855,800 | 723,650 | 663,650 | 329,600 |
| (iv) | වෙනත් ආදායම් | 18,439,000 | 11,423,196 | 10,469,435 | 10,992,080 | 12,808,400 | 16,426,656 | 21,907,042 | 5,400,000 |
| | එකතුව | 28,220,300 | 19,492,748 | 18,161,048 | 15,118,034 | 23,039,200 | 23,510,444 | 28,406,014 | 9,131,179 |

#### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

සමස්ත ආදායම් ප්‍රභවයන්ගෙන් 2016 දෙසැම්බර් 31 දිනට පැවති හිඟය රු.9,131,179 ක් වූ අතර, සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට එම හිඟය රු.15,118,034 ක් වීම හේතුවෙන්, හිඟ ආදායම්වල වර්ධනය සියයට 65 ක් විය.

#### 2.2.3 වරිපනම් හා බදු

2017 ජනවාරි 01 දිනට වරිපනම් හිඟ ශේෂය රු.496,473 ක් වූ අතර, 2017 දෙසැම්බර් මස දක්වා බිල් කිරීම් රු.595,183 ක් විය. මින් 2017 දෙසැම්බර් මස දක්වා අය කර තිබුණේ පිළිවෙලින් රු.131,907 ක් සහ රු.364,069 ක් පමණි. එය ප්‍රතිශතයක් ලෙස සියයට 26 ක් සහ සියයට 61 ක් විය. 2017 දෙසැම්බර් අවසාන දිනය වන විට හිඟය රු.595,681 ක් වීම නිසා, ආදායම් රැස් කිරීම දුර්වල මට්ටමක පැවතුණි.

#### 2.2.4 කඩ කුලී

(අ) සිල්වාස්ලැන්ඩ් පොදු ඉඩමේ ඉදිකර ඇති කඩ කාමර 14 කින් 2008 ජනවාරි 01 දින සිට 2011 මැයි මස දක්වා වර්ෂයකට රු.5,100 ක් බැගින් අය කල කුලිය ගිවිසුම්

සංශෝධනයකින් තොරව 2011 ජුනි සිට 2017 නොවැම්බර් මස දක්වා අඩුවෙන් අය කර තිබුණි. මෙසේ කුලී අඩු කිරීම හේතුවෙන්, එම කාල පරිච්ඡේදයට පමණක් රු.296,068 ක පාඩුවක් සිදුව තිබුණි.

(ආ) සිල්වාස්ලැන්ඩ් පොදු ඉඩමේ අංක 15 දරන කඩ කාමරයෙන් 2008 ජනවාරි මස සිට රු.5,100 ක් බැගින් අය කල වාර්ෂික කුලිය 2012 වර්ෂයේ සිට රු.5,600 ක් දක්වා වැඩි කර ඇතත්, ගිවිසුම් සංශෝධනය කර නොතිබුණි.

(ඇ) කාඩියලෙන කඩ කාමර 02 කින් 2014 වර්ෂයේ සිට 2017 දෙසැම්බර් 17 දක්වා කාලයට අදාළ රු.60,500 ක හිඟ කුලී මුදල අය කර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

---------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.1,999,627 ක් හා මුද්දර ගාස්තු රු.5,000,000 ක් විය. 2018 මාර්තු 31 දින වන විට මුද්දර ගාස්තු සම්පූර්ණයෙන්ම හා උසාවි දඩ රු.574,850 ක් තවදුරටත් අය විය යුතුව තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

3.1 කාර්යසාධනය

----------------

(අ) ගලබඩ දියඇල්ල සංචාරක ආකර්ෂණීය ස්ථානයක් ලෙස සංවර්ධනය කිරීම

--------------------------------------------------------------------------------

පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි ගලබඩ දිය ඇල්ල සංචාරක ආකර්ෂණීය ස්ථානයක් ලෙස හඳුනාගෙන මධ්‍යම පළාතේ වෙළඳ, වාණිජ හා සංචාරක දෙපාර්තමේන්තුව රු.3,449,470 ක ප්‍රතිපාදන යොදා දිය ඇල්ල දක්වා පිවිසුම් මාර්ගයක් සකස් කර, නැරඹුම් ස්ථානයක් ඉදිකර සංචාරක ආකර්ෂණීය ස්ථානයක් ලෙස සංවර්ධනය කර, එය නඩත්තු කර පවත්වා ගෙන යාම සඳහා පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව වෙත පවරා තිබූ නමුත්, මෙම ස්ථානය නැරඹීමට පැමිණෙන දේශීය හා විදේශීය සංචාරකයින්ගෙන් ගාස්තු අය කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා සම්මත කර ගෙන නොතිබීම, දිය ඇල්ල නැරඹීම සඳහා ගමන් කිරීමට තිබෙන මාර්ගය කි.මී.4.5 ක් දුරට වාහන ධාවනය කිරීමට සුදුසු පරිදි සංවර්ධනය කර නොතිබීම හා සංචාරකයින් සඳහා ප්‍රමාණවත් සුහසාධන පහසුකම් නොතිබීම යනාදී අඩුපාඩු පැවතුණි.

(ආ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

--------------------------------

සමාලෝචිත වර්ෂය තුළ කසළ බඳුන් ලබාදීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමට කටයුතු නොකිරීමෙන් ගෘහස්ථ කොම්පෝස්ට් නිෂ්පාදනය කිරීමේ හැකියාව දුර්වල වී තිබුණි. මේ සඳහා වෙන් කර තිබූ රු.50,000 ක අයවැය ප්‍රතිපාදන මුදල ඉතිරි කර තිබුණි.

(ඇ) ක්රියාත්මක නොකළ කර්තව්‍යයන්

------------------------------------

වර්ෂය අවසානයේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම හේතුවෙන්, වැය විෂයන් 03 කට අදාළ සංවර්ධන වැඩසටහන් 03 ක් 2017 නොවැම්බර් මාසය තුළ අනුමැතියට ඉදිරිපත්

කර අනුමැතිය ලැබීම ප්‍රමාද වීම හේතුවෙන් එකී වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි.

(ඇ) අපේක්ෂිත නිමවුම් මට්ටම් ලබා නොගැනීම

-----------------------------------------------

සුභසාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා වැය විෂයන් 15 කට වෙන් කර තිබූ ප්‍රතිපාදන මුදලින් සියයට 87 ක් හෙවත්, රු.678,241 ක් අරමුණුගත කාර්යයන් සඳහා යොදවා ගෙන නොතිබුණි.

(ඉ) අරමුණුවලින් බැහැර ක්‍රියාකාරකම්

-------------------------------------

සභාවේ පෙර පාසල් සඳහා භෞතික සම්පත් ලබාදීම වෙනුවෙන් වෙන් කල රු.50,000 ක මුදලින් අරමුණුගත කාර්යයන් ඉටු කිරීමට කටයුතු නොකර, රු.34,984 ක් වැය කර පෙර පාසල් පාලිකාවන්ගේ සෞන්දර්ය ක්‍රියාකාරකම් වර්ධනය කිරීමේ වැඩමුළුවක් පවත්වා තිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

---------------------------------

(අ) ක්‍රීඩා භූමියකට පමණක් යොදා ගැනීමේ අරමුණුගතව අක්කර 01 ක් පර්චස් 1.08 ක ඉඩමක් 1964 අංක 28 දරන ඉඩම් අත් කර ගැනීමේ (සංශෝධිත) පනත යටතේ සහතික පත්‍රයක් මගින් 1977 ඔක්තෝබර් 18 දින මහනුවර දිස්ත්‍රික් ඉඩම් නිලධාරී විසින් ප්‍රාදේශීය සභාවට පවරා ඇතත්, එම අරමුණට පරිබාහිරව 2010 වර්ෂයේ දී එම ඉඩමේ නව සභා කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකර තිබුණි. එසේ වුවත්, ඊට අදාළ පැවරුම් නියෝග සංශෝධනය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනතේ 21 වගන්තිය ප්‍රකාරව සැලසුම් අනුමත කර ගැනීම සඳහා ඉකුත් වර්ෂ 04 තුළ ලැබී තිබූ ගොඩනැගිලි අයදුම්පත් 515 කින් අයදුම්පත්‍ර 434 ක් අනුමත කර ඇතත්, 2018 අප්‍රේල් වන විටත් අනුකූලතා සහතික 26 ක් පමණක් නිකුත් කර තිබුණි. අනුකූලතා සහතිකයක් නිකුත් කිරීම සඳහා රු.2,500 ක මුදලක් සභාව අය කරන බැවින්, ඉකුත් වර්ෂ 04 තුළ නිකුත් නොකරන ලද අනුකූලතා සහතික 408 ක් සඳහා රු.1,020,000 ක ආදායමක් අහිමි වී තිබුණි.

3.3 මානව සම්පත් කළමනාකරණය

---------------------------------

(අ) අනුමත කාර්ය මණ්ඩලය හා තථ්‍ය කාර්ය මණ්ඩලය අතර තනතුරු 19 ක පුරප්පාඩු පැවතුණි.

(ආ) 2015 වර්ෂයේ ස්ථාන මාරු වී ගොස් ඇති දැනට වැඩ තහනමකට ලක් වී ඇති ආදායම් පරීක්ෂකවරයෙකුගෙන් අය විය යුතු රු.83,220 ක ණය ශේෂයක් හා 2000 වර්ෂයේ වැඩ තහනමකට ලක් වී ඇති හිටපු ලේකම්වරයෙකුගෙන් අය විය යුතු රු.32,227 ක ණය ශේෂය අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

---------------------------

වර්ෂ 05 කට වරක් වරිපනම් තක්සේරුවක් කර බදු අය කළ යුතු වුවත්, 2009 වර්ෂයෙන් පසුව නව තක්සේරුවක් සිදු නොකර පැරණි තක්සේරුව මත 2017 වර්ෂය දක්වා වරිපනම් බදු අය කරමින් පැවතුණි.

3.5 වත්කම් කළමනාකරණය

---------------------------

3.5.1 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම

-------------------------------------------

2012 පෙබරවාරි 06 දින ආපදා කළමනාකරණ අමාත්‍යාංශයෙන් පරිත්‍යාගයක් ලෙස ලැබී තිබූ රු.200,000 ක් වටිනා කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රය කිසිදු ආර්ථික කටයුත්තක් සඳහා යොදා ගැනීමට හෝ ආපසු භාර දීමට හෝ කටයුතු කිරීමකින් තොරව 2012 වර්ෂයේ සිට ස්වාභාවික අපදාවන්ට ලක් වීමට ඉඩ හැර තිබුණි.

3.5.2 නිෂ්ක්‍රිය/ ඌන උපයෝජිත වත්කම්

------------------------------------

(අ) ඇල්ලවත්ත සහ මීපිටිය ජල යෝජනා ක්‍රම සඳහා 2014 වර්ෂයේ මිලදී ගෙන තිබූ රු.1,773,800 ක් වටිනා ජල මනු 362 ක් අදාළ ජල යෝජනා ක්‍රමවල සවි කිරීමකින් තොරව 2018 අප්‍රේල් 04 දින වන විටත් නිෂ්ක්‍රියව ගබඩා කර තිබුණි.

(ආ) පරිගණක උපාංග 04 ක් අලුත්වැඩියා කර භාවිතා කිරීමට හෝ සුදුස්සක් කිරීමට කටයුතු කිරීමකින් තොරව නිෂ්ක්‍රියව තිබුණි.

(ඇ) පුස්තකාල ගොඩනැගිල්ල හා තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය අලුත්වැඩියා කර ඵලදායී කාර්යයකට යොදවා නොතිබුණි.

3.6 ප්‍රසම්පාදනය

--------------

ප්‍රසම්පාදන සැලැස්ම

----------------------

රු.9,615,526 ක ප්‍රාග්ධන වියදම් සභාව දරා ඇති නමුත්, සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

------------------------------------

අයවැය පාලනය

------------------

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛනයට අනුව, ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් අතර ආදායම් විෂයන් 04 ක සියයට 45 සිට සියයට 77 දක්වා ද, වියදම් විෂයන් 06 ක සියයට 25 සිට සියයට 83 ක් දක්වා ද විචලනයන් නිරීක්ෂණය වූ බැවින්, අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණි.

5. පද්ධති හා පාලන

-------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින් වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර, පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධතිය | අඩුපාඩුව |
|---|---|---|
| | --------- | ----------- |
| (අ) | ආදායම් පරිපාලනය | i. හිඟ ආදායම් අය නොකිරීම.<br>ii. බදු ගිවිසුම් විධිමත් නොවීම. |
| (ආ) | වත්කම් කළමනාකරණය | i. නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම් පැවතීම.<br>ii. අයිතිය පවරා ගැනීමේ දුර්වලතා පැවතීම |
| (ඇ) | ණයගැතියන් හා ණයහිමියෝ | දිගුකාලීන ණයගැති ශේෂ නිරවුල් නොවීම. |
| (ඈ) | අයවැය පාලනය | i. ඇස්තමේන්තුගත ආදායම් අය කර නොගැනීම.<br>ii. ඇස්තමේන්තු ප්‍රතිපාදන වැය නොකිරීම. |